වැලිසර සිදුවූ රිය අනතුර සම්බන්ධයෙන් මාධ්‍ය තුළ ආවරණය වී තිබූ අතර, සිදුවීමට සම්බන්ධ තැනැත්තා, බාලවයස්කරුවෙකු/16 හැවිරිදි දරුවෙකු/අවුරුදු 16 ක තරුණයෙකු/පාසල් දරුවෙකු ලෙසින් රූපවාහිනී පුවත් තුළ දැක්වී තිබිණි.

මාධ්‍ය ආචාර ධර්ම ඔස්සේ පෙන්වා දෙන්නේ, සාපරාධී වරදක් සම්බන්ධයෙන් චෝදනා ලත් වයස අවුරුදු 16 ට අඩු හා පෙර දඬුවම් නැති කිසිදු බාලවයස්කරුවකුගේ නම, අනන්‍යතාවය හෙළි කරගත හැකි කරුණු දැන දැනම අනාවරණය නොකළ යුතු බවයි. විශේෂයෙන්ම පාසල් අධ්‍යාපනය අනවශ්‍ය බාධක වලින් තොරව සම්පූර්ණ කර ගැනීමට බාලයන්ට නිදහස තිබිය යුතු බවද එම මාධ්‍ය ආචාර ධර්ම ඔස්සේම පැවසේ.

මෙම රිය අනතුර සම්බන්ධයෙන් නොවැම්බර් 11 දින රූපවාහිනී ප්‍රධාන පුවත් විකාශයන් තුළ වාර්තා වී තිබූ ආකාරය මෙසේ නිරීක්ෂණය කළ හැකි විණි.

1) එම බාලවයස්කරුවාගේ අනන්‍යතාවය හිරු ටීවී නිව්ස් තුළ සැඟවීමකින් තොරව පෙන්වයි.

2) ස්වර්ණවාහිනී, සිරස, අද දෙරණ පුවත් වාර්තාවන්හි එම බාලවයස්කරුවාගේ මුහුණ බොඳ කර තිබේ.

3) ස්වාධීන රූපවාහිනී සහ ජාතික රූපවාහිනී පුවත් වාර්තාවන් තුළ එම බාලවයස්කරුගේ මුහුණ නොපෙන්වයි.

මේ අනුව,

ඔබ සිතනා ලෙසට, සිදුවීමට වගකිව යුතු යැයි පැවසෙන 16 හැවිරිදි පාසල් සිසුවාගේ අනන්‍යතාවය හෙළි කිරීම, කෙතරම් යෝග්‍ය වන්නේද?

එම අනන්‍යතාවය ඇතැම් මාධ්‍ය විසින් නොපෙන්වන්නේ, 16 හැවිරිදි පාසල් සිසුවාගේ අනන්‍යතාවය හෙළි කිරීම මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල නොවන නිසා යැයි ඔබ සිතන්නේද?

ඒ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?